රෙජිස්ට්‍රාර් ජනරාල් දෙපාර්තමේන්තුව
பதிவாளர் நாயகம் திணைக்களம்
REGISTRAR GENERAL'S DEPARTMENT

මගේ අංකය / எனது இல. / My No. } RG/AB/24/වා.ස්.මා/2024

ප්‍රධාන කාර්යාලය
தலைமை அலுவலகம்
HEAD OFFICE

තැ. පෙ. අංකය / த. பெ. இல. / P. O. Box No. } 565

ඔබේ අංකය / உமது இல. / Your No. }

234/A3, ඩෙන්සිල් කොබ්බෑකඩුව මාවත, බත්තරමුල්ල.
234/A3, டென்சில் கொப்பேகடுவ மாவத்தை, பத்தரமுல்லை.
234/A3, Denzil Kobbakaduwa Mawatha, Battaramulla.

දිනය / திகதி / Date } 2024.10.22

අතිරේක රෙජිස්ට්‍රාර් ජනරාල්,

ප්‍රාදේශීය ලේකම්වරුන්,

ප්‍රධාන කාර්යාලයේ සියළුම අංශ භාර මාණ්ඩලික නිලධාරීන්,

කලාප භාර නියෝජ්‍ය රෙජිස්ට්‍රාර් ජනරාල්වරුන්,

මධ්‍යම ලේඛනාගාරය භාර නියෝජ්‍ය රෙජිස්ට්‍රාර් ජනරාල්,

දිස්ත්‍රික් භාර සහකාර රෙජිස්ට්‍රාර් ජනරාල්වරුන්,

සියළුම ඉඩම් සහ දිස්ත්‍රික් රෙජිස්ට්‍රාර්වරුන් වෙත.

<u>ඒකාබද්ධ සේවාවන්හි නිලධාරීන්ගේ වාර්ෂික ස්ථාන මාරු - 2025</u>

මේ සමඟ අමුණා ඇති උපලේඛනයේ සඳහන් ස්ථාන මාරුවීම් 2025.01.01 දින හෝ නිලධරයන්ගේ නම් වලට ඉදිරියෙන් දක්වා ඇති දින සිට ක්‍රියාත්මක වන පරිදි අනුමත කරන ලද බව ඒකාබද්ධ සේවා අධ්‍යක්ෂ ජනරාල්ගේ අංක COM/Trans/V/ වා.ස්.මා/2025 හා 2024.10.18 දිනැති ලිපියෙන් දන්වා ඇත. මේ බව ඔබ කාර්යාලයේ /අංශයේ අදාළ නිලධරයන් වෙත දන්වා නියමිත දිනයේදී අභිනව කාර්ය ස්ථානයේ වැඩ භාර ගන්නා ලෙසට ඔවුනට දැනුම් දෙනු මැනවි. රාජ්‍ය සේවා කොමිෂන් සභාව/ අල්ලස් හෝ දූෂණ චෝදනා විමර්ශන කොමිෂන් සභාව/ මැතිවරණ කොමිෂන් සභාව යන ස්ථාන වලට ස්ථාන මාරු කරන ලද නිලධරයන්ගේ ස්ථාන මාරු ක්‍රියාත්මක විය යුත්තේ අදාළ ආයතන ප්‍රධානීන්ගේ එකඟත්වයට යටත්ව බවද දන්වමි.

2. මෙම ස්ථාන මාරු නියෝගවලට යටත් නිලධරයෙකුට 2024.12.31 දින දක්වා දීර්ඝ කරන ලද, මීට ඉහතදී නිකුත් කර ඇති ස්ථාන මාරු නියෝගයක් වේ නම් එවැනි නිලධරයකුට නැවත 2025 වාර්ෂික ස්ථාන මාරු නියෝග මඟින් වෙනත් ස්ථාන මාරු නියෝගයක් ලබාදී ඇත්නම් එහිදී පෙර ස්ථාන මාරු නියෝගය බල රහිත වන බව සලකන්න.

3. මෙම ස්ථාන මාරු සිදු කිරීමේදී මාරුවීම් කමිටුව විසින් අනුගමනය කරන ලද ස්ථාන මාරු පටිපාටිය, 2024.07.29 දිනැති අංක 02/2024 දරන ඒකාබද්ධ සේවා චක්‍රලේඛයෙහි ඇතුළත්ව ඇත. එම චක්‍රලේඛයෙහි හෝ අංක 2310/29 දරන අති විශේෂ ගැසට් පත්‍රයේ ඇතුළත් රාජ්‍ය සේවා කොමිෂන් සභා කාර්ය පටිපාටික රීති (කාණ්ඩ අංක 1) හි XVIII පරිච්ඡේදයේ විධිවිධානවලට අනුකූලව තමන්ගේ ස්ථාන

එච්.එච්.එල්.ද. සොයිසා
නියෝජ්‍ය රෙජිස්ට්‍රාර් ජනරාල් (පාලන)
රෙජිස්ට්‍රාර් ජනරාල් දෙපාර්තමේන්තුව
234/ඒ 3, ඩෙන්සිල් කොබ්බෑකඩුව මාවත,
බත්තරමුල්ල.

දුරකථන අංකය / தொலைபேசி இல. / Telephone No. } 2889488 2889489
ෆැක්ස් අංකය / தொலைநகல் / Fax No. } 2889491
වෙබ් අඩවිය / இணையத்தளம் / Website } www.rgd.gov.lk
විද්‍යුත් තැපෑල / மின்னஞ்சல் / E-mail } rgd@sltnet.lk rg@rgd.gov.lk

මාරු ඉල්ලීම් පිළිබඳව වාර්ෂික ස්ථාන මාරු කමිටුවේ අවධානයට යොමුවී නොමැත්තේ නම් පමණක් වාර්ෂික ස්ථාන මාරු යෝජනා සමාලෝචන කමිටුව වෙත අභියාචනා ඉදිරිපත් කළ හැකිය.

4. රාජ්‍ය සේවා කොමිෂන් සභා ලේකම්ගේ අංක PSC/APL/07/14/2013 හා 2013.09.13 දිනැති ලිපියෙහි නියෝග අනුව වාර්ෂික ස්ථාන මාරු සමාලෝචන කමිටු තීරණ ලබා දීමෙන් පසුව නැවත සිදු කරනු ලබන අභියාචනා සම්බන්ධයෙන් රාජ්‍ය සේවා කොමිෂන් සභාව විසින් තීරණය ලබා දීමෙන් අනතුරුව ඉදිරිපත් කරනු ලබන අභියාචනා, දුක් ගැනවිලි හෝ ආයතන ප්‍රධානීන්ගේ නිර්දේශ මත වාර්ෂික ස්ථාන මාරු තීරණ නියමිත දිනෙන් පසුවට කල් දමනු නොලැබේ. වාර්ෂික ස්ථාන මාරු සම්බන්ධයෙන් වූ අභියාචනාවකට රාජ්‍ය සේවා කොමිෂන් සභාව විසින් ලබා දුන් තීරණයන්, එකී තීරණ ක්‍රියාත්මක වීම වළකාලන නියෝගයක් නොමැති නම් වහාම ක්‍රියාත්මක කළ යුතුය.

5. ඒකාබද්ධ සේවයේ සියළු නිලධාරීන් වාර්ෂික ස්ථාන මාරු සම්බන්ධ අභියාචනා ඉදිරිපත් කිරීම සඳහා අන්තර්ජාලයට පිවිසීමට භාවිතා කරනු ලබන්නේ,

i. LGN Wi-Fi ජාලය නම් http://10.250.1.112/misco ඔස්සේද,
ii. වෙනත් ජාලයක ඔස්සේ අන්තර්ජාල පහසුකම් සලසා ගන්නේ නම් http://43.224.125.68/misco යන වෙබ් ලිපිනය ඔස්සේද.

මාර්ගගත මෘදුකාංගය (Online Application) තුලට පිවිස, තම අභියාචනා 2024.11.01 දිනට පෙර ඉදිරිපත් කළ යුතු වේ. එම අයදුම්පතෙහි දෘඩ පිටපතක් ආයතන ප්‍රධානියා මඟින් වාර්ෂික ස්ථාන මාරු සමාලෝචන කමිටුව වෙත යොමු කරන ලෙසද කාරුණිකව දන්වමි.

6. ඔබ කාර්යාලයෙන් / අංශයෙන් පිටතට ස්ථාන මාරුවීම් ලබා දී ඇති නිලධාරීන්, අනුප්‍රාප්තිකයන් පැමිණෙන තෙක් රඳවා නොගෙන නියමිත දින නව සේවා ස්ථානයේ රාජකාරි භාර ගැනීමට හැකි වන සේ මුදා හැරීමට කටයුතු කරන ලෙස දන්වන අතර, මෙම ස්ථාන මාරුවීම් ප්‍රමාදයෙන් තොරව ක්‍රියාත්මක කළ යුතු බැව් ද දන්වමි. විධිමත් අනුමැතියකින් තොරව මෙම ස්ථාන මාරුවීම් නියෝග පැහැර හැර සිටින නිලධාරීන් සම්බන්ධයෙන් 02/2024 චක්‍රලේඛයේ 9:4 වගන්තිය අනුව කටයුතු කළ හැකි බවද වැඩිදුරටත් දන්වා සිටිමි.

7. දැනට සේවය කරන කාර්යය ස්ථානයේ නියමිත කාලය සම්පූර්ණ කර නොමැති නිලධරයන්ට මෙම වාර්ෂික ස්ථාන මාරු වෙනුවෙන් ගමන් වියදම් ගෙවනු නොලැබේ. දැනට සේවය කරන කාර්ය ස්ථානයේ නියමිත කාලය සම්පූර්ණ කර ඇති නිලධරයන් සම්බන්ධයෙන් ආයතන සංග්‍රහයේ සඳහන් විධිවිධාන වලට යටත්ව ගමන් වියදම් ගෙවිය යුතු වේ. උපවේශන දීමනා ගෙවනු නොලැබේ.

8. අමාත්‍යාංශයන්හි විෂය පථය වෙනස්වීම මත ඇතැම් නිලධාරීන්ගේ සේවා ස්ථානයන්හි වෙනස්කම් සිදුව ඇති බැවින් හා එවැනි සේවා ස්ථානයක සේවය කරන නිලධාරියකු හට 2025 වාර්ෂික ස්ථාන මාරු යටතේ ස්ථාන මාරු ලබාදී ඇත්නම්, එම නිලධාරියා මේ වන විට සේවය කරන සේවා ස්ථානය වෙත ඔහු/ඇයගේ

ස්ථානයේදී 2022.06.22 දිනැති රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ අංක 14/2022 හා ඊට ආනුෂාංගික චක්‍රලේඛ විධිවිධාන යටතේ නිවාඩු අනුමත නොකළ යුතු වේ.

10. මැතිවරණ කොමිෂන් සභා ලේකම්ගේ අංක EC/SO/PE/2024/6-4B (i) හා 2024.10.12 දිනැති ලිපිය මඟින්, මැතිවරණ ක්‍රියාවලියට බාධාවක් නොවන පරිදි ඒකාබද්ධ සේවයේ නිලධාරීන්ගේ වාර්ෂික ස්ථාන මාරු ක්‍රියාවලියේදී ඉදිරි කටයුතු සාමාන්‍ය පරිදි සිදු කිරීම හා 2025 වාර්ෂික ස්ථාන මාරු 2025.01.01 දින සිට ක්‍රියාත්මක කිරීම සඳහා ලබාදී ඇති මැතිවරණ කොමිෂන් සභාවේ එකඟතාවය මත මෙම ස්ථාන මාරු තීරණ නිකුත් කර ඇත.

ඒ.එච්.එල්. ද සොයිසා
ජ්‍යෙෂ්ඨ නියෝජ්‍ය රෙජිස්ට්‍රාර් ජනරාල් (පාලන)
රෙජිස්ට්‍රාර් ජනරාල් වෙනුවට

දුරකථන අංක : 0112072038
ෆැක්ස් අංක : 0112889493
විද්‍යුත් ලිපිනය : sdrg@rgd.gov.lk

<u>පිටපත්:-</u>

1. ඒකාබද්ධ සේවා අධ්‍යක්ෂ ජනරාල් - කරු. දැ.ගැ.ස.